**2021.02.15**

ප්‍රිය ශිෂ්‍යය/ශිෂ්‍යාව

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා 2019/2020 ප්‍රවේශ වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ඔබ ලියාපදිංචි කර ඇත.

**ඒ අනුව, නවක සිසුන් ඇතුලත් කර ගැනීමේ කටයුතු සඳහා 2021.02.19 දින පෙ.ව.8.00 ට ඔබ** රුහුණ විශ්වවිද්‍යාලයේ රබීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවණාගාරය වෙත වාර්තා කල යුතුය.

විශ්වවිද්‍යාල භූමියට ඇතුල් වීම සඳහා **ඔබගේ ජාතික හැඳුනුම්පත** හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඔබ වෙත එවන ලද ලිපිය ප්‍රධාන පිවිසුම් දොරටුවේ ආරක්ෂක අංශය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**රජයේ සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් වලට අනුව මෙම ක්‍රියාවලිය සිදුවන බැවින් ඔබ විසින් එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. ඔබ සමග පැමිණිය හැක්කේ තවත් එක් අයකුට පමණක් (මව/පියා/භාරකරු) බව තරයේ අවධාරණය කරනු ලැබේ.**

ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත පැමිණීමේදී පහත ලියකියවිලි රැගෙන පැමිණිය යුතුවේ.

1. ජාතික හැඳුනුම්පත
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඔබ වෙත එවන ලද ලිපිය
3. සෙ.මී. 3.5 x 4.5 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප අටක් දක්වා ඇති ශිෂ්‍ය අංකය හා ඔබගේ උසස් පෙළ අංකය සඳහන් කරනු ලැබූ ලියුම් කවරයක විශ්වවිද්‍යාලය වෙත රැගෙන ආ යුතුය. (**සෑම ඡායාරූපයකම පිටුපස ජාතික හැඳුනුම්පත් අංකය, අ.පො.ස.(උ.පෙ.) විභාග අංකය යොදා තම ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී / පාසලේ විදුහල්පති ලවා සහතික කර තිබිය යුතුය.**)
4. ඔබ විසින් රු.1000/- ක මුදලක් පහත දැක්වෙන ගිණුම් අංකයට බැරකර අදාල රිසිට් පත.
   "University of Ruhuna Collection Account" 2010218000000021 (මහජන බැංකුව ඕනෑම ශාඛාවක්)

එදිනට නියමිත වැඩසටහන පහත දැක්වේ.

| | |
|---|---|
| පෙ.ව. 8.00 සිට පෙ.ව.11.00 | සිසුන් ඇතුලත් කර ගැනීම |
| පෙ.ව. 11.00 සිට ප.ව. 12.30 (සිසුන් සහ දෙමාපියන් සඳහා) | උපකුලපතිතුමාගේ දේශනය |
| ප.ව.12.30 සිට ප.ව. 1.30 | දිවා විවේකය |
| ප.ව.1.30 සිට ප.ව.1.50 | ඉංග්‍රීසි පරීක්ෂණය පැවැත්වෙන ශාලා වලට යොමු කිරීම |
| ප.ව. 2.00 සිට ප.ව. 3.30 | ඉංග්‍රීසි පරීක්ෂණය |

**විමසීම 0412222681 දිගුව 2134/2135**

Ulsansala

සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය කටයුතු

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.